Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 7 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 40 S I,II |
|---|---|---|

**පෙරදිග සංගීතය** — කාලය පැය දෙකයි

නම / විභාග අංකය : ....................................................................................................

සැලකිය යුතුයි :- • ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. සංගීතයේ දී තාලයට හිමි වන්නේ වැදගත් ස්ථානයකි, තාලයට හිමි වේගය හෙවත් තාලයේ වේගය හඳුන්වනු ලබන්නේ,
   (i) මාත්‍රා නමිනි. (ii) ආවර්ථයක් නමිනි.
   (iii) ලය නමිනි. (iv) තනි තිතේ තාල පද නමිනි.

2. පහත පිළිතුරු අතරින් දේශාභිමාන ගීත පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   (i) අඹ දඹ නාරං, රත්න දීප ජන්ම භූමි, මේ උදාර ලංකා භූමිය යි.
   (ii) ලෝකෙන් උතුම් රට, දන්න වංහුං අප, ඉඳුනිල් ගගුලැල්
   (iii) කටු අකුලේ මල් ඇහැරේ, හෙළ ජාතික අභිමානේ, රත්න දීප ජන්ම භූමි
   (iv) මේ උදාර ලංකා භූමිය යි, දකුණ නැගෙනහිර, ලෝකෙන් උතුම් රට

3. සමග්‍රහයෙන් ආරම්භ වන ගීත ඇතුළත් පිළිතුර වනුයේ,
   (i) ලංකා ලංකා පෙම්බර ලංකා, පෙරදිග මුතු ඇටයයි මේ
   (ii) හෙළ ජාතික අභිමානේ, ගලන ගඟකි ජීවිතේ
   (iii) ලංකා ලංකා පෙම්බර ලංකා, සසර වසන තුරු
   (iv) පෙරදිග මුතු ඇටයයි මේ, හෙළ ජාතික අභිමානේ

4. කෝමළ ගාන්ධාරය සහ කෝමළ නිශාදය ඇතුළත් ආරෝහණ ක්‍රමයට ගොඩනැගී ඇති ස්වර අභ්‍යාසය තෝරන්න.
   (i) සරිගුම, සරිගුස, රිගුමප, ගුමපධ (ii) සරිගුස, රිගුමරි, ගුමපගු, පධනිප
   (iii) සරිගු, රිගුම, ගුමප, මපධ,පධනි (iv) සනිධ, නිධප, ධපම, පමගු

5. අපරදිග සංගීතයේ ස්වර නාම පහත අයුරින් ලියූ විට ඒ සඳහා පිළිවෙලින් පෙරදිග සංගීතයේ යෙදිය හැකි ස්වර සංකේත තෝරන්න.
   Do, So, Mi, Re
   (i) රි, ග, ම, ස (ii) ස, ප, ග, රි (iii) ස, රි, ග, ප (iv) ස, ග, ප, රි

6. ගීතය මගින් යම් පිණිවිඩයක් උපදේශයක් ලබාදෙන ගී උපදේශාත්මක ගී යනුවෙන් හැඳින්විය හැකිය. පහත ගී වලින් උපදේශාත්මක ගීතයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
   (i) කරුණාව සමඟ හොඳ හිත, දූඩි කළ මාතා, නොමඟ නොයන් පුතේ
   (ii) අහන්න මගෙ හොඳ පුංචි පුතේ, අඹ දඹ නාරං කෙසෙල් දෙල්
   (iii) සමන් වැලේ මල් ජයට පිපිලා, පාන් කිරිත්තා තක්කිට තරිකිට
   (iv) දූඩි කළ මාතා, පාන් කිරිත්තා තක්කිට තරිකිට, දූ පුතුනේ රට අපේය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

7. ස්වර ස්ථාපන ගීත මඟින් ස්වර ගායනය පිළිබඳ දක්ෂතා වර්ධනය කරගත හැකිය. පහත සඳහන් පිළිතුරු අතුරින්
කෝමළ ග, නි ඇතුළත් ස්වර ස්ථාපන ගීත ඇතුලත් පිළිතුර තෝරන්න.
(i) පොත පත කියවා නුවණ ලබා, සඳ පහනේ කිරි බැබළී (ii) පුංචි තාරකා, එකට සතුටු සාගරේ
(iii) කඳු පෙළ අතරේ, හෝ හෝ ගා (iv) බැතිනා සිරිපා, ඇත ඇදී යළි

8. ශ්‍රී වික්‍රම රාජසිංහ, රාමායනය, දුටුගැමුණු වැනි පැරණි නාට්‍ය වල ගැයූ ගී නූර්ති ගීත වේ. පහත දැක්වෙන ගී පද
අතරින් නූර්ති ගීත පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
(i) අඹ දඹ නාරං කෙසෙල් දෙල්, කටු අකුලේ මල් ඇහැරේ
(ii) දම් වැසි වස්සන ලෝකේ, දන්න වංහුං අප කන්න සාමි
(iii) සවන පිනන ගීත මිහිර, දම් වැසි වස්සන ලෝකේ
(iv) දන්න වංහුං අප කන්න සාමි, කඳු කඳු නැගෙනා

9. ගායනයත් සමග නර්තනයේ යෙදෙන ගීත විශේෂයක් ලෙස රබන් ගී දැක්විය හැකිය. රබන් ගී ගායනයේදී වාදනය කරනු ලබන්නේ,
(i) බංකු රබාන යි. (ii) බටනලාව යි. (iii) අත් රබාන යි. (iv) බැන්ජෝ ගිටාරය යි.

10. ''ගම්බිර කාලිංග නුවර නිරිඳුගේ වාසල පුරයට'' යන කෝළම් ගීත ගයනු ලබන්නේ,
(i) ලෙන්චිනා චරිතය විසිනි. (ii) පොතේ ගුරු විසිනි.
(iii) ජසයා චරිතය විසිනි. (iv) සබේ විදානේ විසිනි.

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා, දී ඇති පිළිතුරු අතරින් වඩාත් සුදුසු පිළිතුර හිස්තැන මත ලියන්න.**

(ත්‍රී තාල්, විෂම ග්‍රහයෙන්, මිස්රාබ්, දැල් ගී, පහතරට ජන නාට්‍ය, පාරු ගී, අව ග්‍රහයෙන්)

11. මුහුදේ දැල් ඇදීමේදී, ඔරුව මුහුදට තල්ලු කිරීමේ දී ධීවරයන් විසින් සාමුහිකව ගයන ගීත ................................ නමින් හැඳින්වේ.

12. හාස්‍ය රසය ජනිත කරවන ගීත ඇතුළත්, වෙස් මුහුණු භාවිත කරමින් රංගනයේ යෙදෙන කෝලම් නාට්‍ය ................................................. විශේෂයකි.

13. තනි තිත, දෙතිත, තුන් තිත ආදී වශයෙන් තිත් ප්‍රභේද කිහිපයක් ඇත. තනි තිතට අනුව යන හින්දුස්ථානි තාල පදයක් ලෙස .................................................... දැක්විය හැකිය.

14. ග්‍රහය යනු, ග්‍රහණය කර ගැනීමේ අරුත දැක්වෙන්නකි, ඒ අනුව හෙළ ජාතික අභිමානේ ගීතය .......................... ගායනා වේ.

15. සිතාරය හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩයක් වන අතර, ඉතා මිහිරි හඬක් නගන වාද්‍ය භාණ්ඩයකි. සිතාරය වයනුයේ ........................................................ යැයි හඳුන්වන උපකරණයක් පැළඳීමෙනි.

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට අදාළ ප්‍රකාශ නිවැරදි නම් (✓ ) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති හිස්තැන තුළ යොදන්න.**

16. අවග්‍රහය යනු, ග්‍රහය හෙවත් පිහිටුවීම එකවර නොවී ආඝාතය ප්‍රථමයෙනුත්, ගීතය දෙවනුවත් ආරම්භ කිරීමයි. (..................)

17. නූර්ති ගීත ගැයීමේ දී වාදනය සඳහා මද්දලය සහ ගිටාරය යොදා ගනී. (..................)

18. සඳුන් කොකුම් මොර සුගාන යනු, රබන් ගීතයකි. (..................)

19. සරල නාද රටා යොදාගෙන ගයනු ලබන දරු නැළවිලි ගීයක් ලෙස ''කටු අකුලේ මල් ඇහැරේ'' ගීතය හඳුන්වා දිය හැකිය. (..................)

20. ශුද්ධ ස්වර හතයි, කෝමළ ස්වර හතරයි, තීව්‍ර ස්වර එකක් එකතු වී ස්වර දොළස සෑදේ. (..................)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II පත්‍රය

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

1. (i) පහත සඳහන් ස්වර අභ්‍යාසය ආරෝහණ සහ අවරෝහණ ආකාරයට ගොඩනගන්න.
සගරිස, රිමගරි ........................ (ලකුණු 02)

(ii) ළමා ගීත රචකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ස්වර දොළස පිළිවෙලින් පෙරදිග සංගීත සංකේත ඇසුරින් ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) ස්වර පුවරුවක් ඇඳ ස්වර දොළස නම් කරන්න. (ලකුණු 02)

(v) ඔබ උගත් නූර්ති ගීයක් ලියා දක්වන්න. (ලකුණු 02)

2. (i) කෝළම් ගී පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 02)

(ii) කෝළම් ගීයක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) දරු නැලවිලි ගීයක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) කෝමළ ග සහ නි යෙදෙන ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

3. (i) දූල් ගී පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ උගත් දූල් ගීයක් ලියන්න. (ලකුණු 02)

(iii) උපදේශාත්මක ගී පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

4. (i) රබන් ගී පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 03)

(ii) ඔබ උගත් දේශාභිමාන ගීයක් ලියන්න. (ලකුණු 03)

(iii) ලය පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

5. (i) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන අවම වශයෙන් පද හතරකින් යුත් ගීතයක් නිර්මාණය කරන්න.(සුළඟ, වැස්, හිරු උදාව, දිය ඇලි, අම්මා) (ලකුණු 04)

(ii) තාලය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 03)

(iii) උපදේශාත්මක ගීයක පළමු කොටස පමණක් ලියා දක්වන්න. (ලකුණු 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**7 ශ්‍රේණිය**

## වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

පෙරදිග සංගීතය - I පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01) | III | 06) | II | 11) | දැල් ගී | 16) | ✓ |
| 02) | IV | 07) | I | 12) | පහතරට ජන නාට්‍ය | 17) | X |
| 03) | I | 08) | II | 13) | ත්‍රී තාල් | 18) | ✓ |
| 04) | III | 09) | III | 14) | විෂම ග්‍රහයෙන් | 19) | X |
| 05) | II | 10) | III | 15) | මිස් රාබ් | 20) | ✓ |


II කොටස

01. I. ආරෝහණ - සගරිස, රිමගරි, ගපමග, මධපම, පනිධප, ධසංනිධ (ලකුණු 02)
අවරෝහණ - සංධනිසං, නිපධනි, ධමපධ, පගමප, මරිගම, ගසරිග (ලකුණු 02)

II. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි
මුනිදාස කුමාරතුංග
අරිසෙන් අහුබුදු (ලකුණු 02)

III. ස රි රි ගු ග ම ම් ප ධු ධ නි නි (ලකුණු 02)

IV.




(ලකුණු 02)

V. 7 ශ්‍රේණියේ උගත්, දම්වැසිවස්සන ලෝකේ
අඹ දඹ නාරං යන ගීත වලින් එකක් ලියා තිබීම.

02. I. කෝලම් පිළිබඳව අවම වශයෙන් කරුණු තුනක් හතරක් ඇතුළත් කොට සැකසූ විස්තරයක් ලියා (ල. 02) තිබිය යුතුය.
II. මං වගේ ජේඩි කතක් මනා, ගම්බිර කාලිංග නුවර ..... යනාදි ගීත වලින් එකක් ලියා තිබිය යුතුය.(ල. 02)

III. විෂය නිර්දේශයට අයත් දරු නැළවිලි ගීයක් ලියා තිබිය යුතුය. (ලකුණු 02)
IV. පොත පත කියවා, පුංචි තාරකා, හෝ හෝ ගා රැල්ල බිඳෙනවා, සිරි සාර අති ශාන්ත, සඳ පහනේ කිරි බැබළී යන ගීත වලින් එකක් ලියා තිබිය යුතුය. (ලකුණු 04)

03. I. ධීවරයන් විසින් ගායනා කරයි. ඔරුව මුහුදට තල්ලු කිරීමේදී, දැල ගොඩට ඇදීමේදී ගයයි. සාමූහිකව ගායනා කරයි. අර්ථ විරහිත පද ද යොදා ගැනේ. ආදී.... ලෙස කරුණු ගොනු කොට ලියා තිබිය යුතුය. (ලකුණු 04)
II. ● ඒ ආලේ හෙලෙයි ලෝ - මණ්ණඩිරාලෙ හෙලෙයිලෝ
● සන්තානම් පල්ලි යන්න - ලේලකඩි ලේලෝ ..... ආදී ගීත වලින් එකක් ලියා තිබිය යුතුය. (ලකුණු 02)
III. සමාජයට යම්කිසි පණිවිඩයක්, ආදර්ශයක් ලබා දීම සඳහා නිර්මිත ගී බව පිළිතුරෙහි සඳහන් විය යුතු අතර, උදාහරණ දෙමින් පිළිතුර ගොඩනගා තිබිය යුතුය. (ලකුණු 04)

04. I. රබන් නැටුම සම්බන්ධ ගී, අත් රබන්, බංකු රබන්, ඈත. රබන් යන නාමය ලැබුණු ආකාරය, රබන් ගී ප්‍රසිද්ධ ප්‍රදේශ අදිය ඇතුලත්ව පිළිතුර ගොඩනගා තිබිය යුතුය. (ලකුණු 03)
II. රත්න දීප ජන්ම භූමි
ලෝකෙන් උතුම් රට
දකුණ නැගෙනහිර
ලංකා ලංකා පෙම්බර ලංකා
මේ උදාර ලංකා භූමියයි.... යනාදී ගීත අතරින් එකක් ලියා තිබිය යුතුය. (ලකුණු 03)
III. තාලයේ වේගය ලය වේ. විලම්භ ලය, මධ්‍ය ලය හා ධෘත ලය නමින් ලය ත්‍රිවිධ වේ, ආදී ...... ලෙස පිළිතුර ගොනු කොට ලියා තිබිය යුතුය. (ලකුණු 04)

05. I. ලියා ඇති මාතෘකාවට අනුකූලව නිර්මාණාත්මක බව සලකා ලකුණු ලබා දිය යුතුය. (ලකුණු 04)
II. තාලය යනු සංගීතයේදී කාලය මනින මිම්ම වේ. එහි කුඩාම ඒකකය මාත්‍රා වේ... ආදී ලෙස විස්තර ලියා තිබිය යුතුය. (ලකුණු 03)
III. විෂය නිර්දේශයේ උගත් උපදේශාත්මක ගීයක පළමු කොටස නිවැරදි ලෙස ලියා ලිබිය යුතුය. (ල.03)